# ජයග්‍රාහකයන්ගේ වංසකතා

අපේ සාකච්ඡාවට බඳුන් වී ඇත්තේ සිංහල ජාතියේ සම්භවය පිළිබඳ ප්‍රවාද දෙකකි. මේ ප්‍රවාද දෙක ම සංයුක්ත ප්‍රවාද බව අමතක නොකළ යුතු ය. ඒ ප්‍රවාදවලින් කියැවෙනුයේ එක් ජාතියක සම්භවය පිළිබඳ කතා මිස සාධාරණ වශයෙන් ජාතියක සම්භවය පිළිබඳ කතාව නො වෙයි. ඕනෑම ජාතියක සම්භවය පිළිබඳ ප්‍රවාදයක් වේ නම් එය වියුක්ත ප්‍රවාදයක් වෙයි.

ගිය සතියේ සඳහන් කෙරුණු ප්‍රවාද දෙකෙන් ම කියැවුනේ පඬුඅබා රජු විසින් යක්ෂ නාග දේව හා රාක්ෂස යන ගෝත්‍ර එකතුකර සිංහල ජාතිය ගොඩනැගුණු බව ය. එක් ප්‍රවාදයකින් පමණක් සිංහ වාංශිකයන් ඝාතනය කෙරුණු බව පැවසිණි. අනෙක් ප්‍රවාදයෙන් සිංහයන්ට කුමක් විණි ද යන්න ගැන කිසිවක් නො කියැවෙයි. ඒ අතර සිංහල යන්න සිව්හෙළ යන්නෙන් බිඳී ආ බව ඒ ප්‍රවාදයෙන් කියැවෙයි. සිංහයන් ලානය කිරීම හේතුවෙන් සිංහල වී ය යන්න අනෙක් ප්‍රවාදයෙන් කියැවෙයි.

ඒ සිංහල වීම පිළිබඳ කතා දෙකෙහිම ඇත්තේ ව්‍යාජ බවකි. සිංහ වාංශිකයන් අත්හැර සිංහල ජාතිය ගොඩනැගීමේ ආශාවෙන් ප්‍රවාද තැනුවකු හෝ තැනුවන් අතින් ඒ ප්‍රවාද නිර්මාණය වී ඇති බව පැහැදිලි ය. එහෙත් ඉතා පැහැදිලිව ම වංශකතාවලින් කියැවෙන්නේ පඬුඅබා රජු විසින් සිංහයන් කිහිප දෙනකු පමණක් ඝාතනය කෙරී ඇති බව ය. මෙහි දී අවශ්‍ය නම් යම් අයකුට වංශකතා වැරදි බවත් එහි සියළු සිංහයන් ඝාතනය කෙරුණු බව කියා නැත්තේ කරුණු වසං කිරීමට අවශ්‍ය නිසා බවත් පැවසීමට හැකි ය.

එහෙත් ගැටළුව එතැනින් නො විසඳෙයි. යක්ෂ ගෝත්‍රිකයන් දිගින් දිගට ම (අනුරාධපුර) රාජ්‍යය සමග ගැටුම් ඇතිකරගෙන ඇති බව පැහැදිලි ය. නාග ගෝත්‍රියන් ගැන ඉතා අඩුවෙන් වංශකතාවලින් කියැවෙද්දී යක්ෂ ගෝත්‍රිකයන් ගැන වංශකතාවල වැඩියෙන් සඳහන් වන්නේ ඇයි? වංශකතාවලට අනුව යක්ෂයන් රාජ්‍යය සමග ගැටුනේ ඇයි? පඬුඅබා රජු දවස යක්ෂ නාග රාක්ෂස දේව ගෝත්‍රිකයන්ගේ එකතුවෙන් පමණක් සිංහල රාජ්‍යය ගොඩනැගිණි නම් යක්ෂයන් ගැටුම් ඇතිකරගත්තේ කිනම් ගෝත්‍රයක් සමග ද? ඒ සිංහලයන් බවට පත් වූ නාගයන් සමග ද, එසේත් නැත්නම් දේව ගෝත්‍රිකයන් සමග ද? එහෙත් ඒ එකදු ගෝත්‍රයක් සමගවත් ගැටුම් ඇතිකරගත් බවක් සඳහන් වූ තැනක් නො දනිමි. යක්ෂ ගෝත්‍රිකයන් ගැටුම් ඇතිකරගෙන ඇත්තේ අර්ධ වෛදිකයන් සමග බව පැහැදිලි ය.

අපට මේ සියල්ල ම වංශකතාකරුවන්ගේ අසත්‍ය ප්‍රකාශ යැයි බැහැරකළ නො හැකි ය. අනෙක් අතට අපට මෙවැනි ප්‍රශ්නයක් පැන නගියි. වංශකතාකරුවන් සිංහ වංශයට පක්ෂපාතීව වැරදි කරුණු ලියා ඇතැයි උපකල්පනය කරමු. එයින් කියැවෙන්නේ කුමක් ද? සිංහ වංශයට, එනම් අප සඳහන් කරන අන්දමට අර්ධ වෛදිකයන්ට රාජ්‍යයේ යම් බලයක් තිබුණු බව ඉන් පැහැදිලි වෙයි.

ඉතිහාසය ලියනු ලබන්නේ ජයග්‍රාහකයන් විසින් යැයි කතාවක් ඇත. මෙහි යම් සත්‍යයක් ඇත. පරාජිතයන්ට ඉතිහාසයක් ලියන්නට හැකි කමක් නැත. ඉතිහාසයක් ලියනු තබා තමන්ට කීමට අවශ්‍ය ඉතිහාසයක් මුඛ පරම්පරාවෙන් වුව ද පවත්වාගෙන යැමට පරාජිතයන්ට අපහසු වෙයි. එවැනි ඉතිහාසයක් ඇතැම් විට රාජද්‍රෝහි ඉතිහාසයක් ලෙස හංවඩුගසා පරාජිතයන්ට දඬුවම් පැමිණවීමේ ඉඩකඩ පවතින බව අමුතුවෙන් කිවයුතු නො වේ.

ඉතිහාසයේ සඳහන් කරුණු කුමක් වුව ද ඉතිහාසයේ ලියා ඇත්තේ ජයග්‍රාහකයන්ගේ මතය යැයි බොහෝ විට සැලකිය හැකි බැවින් අඩුම තරමින් ඉතිහාසය කියවීමෙන් ජයග්‍රාහකයන් වූයේ කවුද යන ප්‍රශ්නයට පිළිතුරක් එහි නිරවද්‍යතාව පිළිබඳ සැහෙන ප්‍රමාණයක වැඩි සම්භාවිතාවෙන් ලබාගත හැකි ය. මහාවංසය ඇතුළු වංසකතා ලියැවී ඇත්තේ සිංහ වාංශිකයන්ට පක්ෂපාතී ව නම් ඉන් කියැවෙන්නේ සිංහයන් ජයග්‍රහණය කර ඇති බව යැයි කිවහැකි ය.

මහාවංසය හා අනෙක් වංසකතා දීපවංසයට ද වඩා සිංහ වාංශිකයන්ට පක්ෂව ලියැවී ඇත්නම් එයට හේතු නොසොයා අවසානයේ දී කෙසේ හෝ මහාවිහාරයට පහරදීම සඳහා පොටක් පාදාගැනීමට ඇතැමුන් පෙළඹෙන බව පැහැදිලි ය.

© Prof. Nalin De Silva

ඇතැමුන් පඬුඅබා ඔසවන්නේ පඬුඅබාට හෝ සිංගලයන්ට හෝ ඇති පක්ෂපාතීත්වයකට වඩා මහාවිහාරයට පහර දීමට ය. මෙහි දී කුමාරතුංග මුනිදාස මහතා හා හෙළ හවුළ පිළිබඳ යමක් නොකියාම බැරි ය. පඬුඅබාගේ ජන්මය පිළිබඳ ව මහාවංසයෙහි සඳහන් මතයට විරුද්ධ මතයක් ප්‍රකාශ කළ තැනැත්තන් අතර කුමාරතුංග මහතා ප්‍රධානියෙක් විය. ඒ මහතාගේ මත අදත් හෙළ හවුළේ ඉතිරිව ඇති කිහිපදෙනකු පුනරුච්චාරණය කරනු දැකිය හැකි ය. මෙරට ඉතිහාසය මෙරටින් ම ගොඩනැගීම හෙළ හවුළේ අභිලාෂය වූ බව පෙනෙයි.

හෙළ හවුළේ මතය වූයේ පඬුඅබාගේ පියා චිත්තරාජ නම් යක්ෂ ගෝත්‍රික ප්‍රධානියා වූ බව ය. ඔවුන් ඒ මතය වැළඳ ගත්තේ කිසියම් පොතක හෝ සෙල්ලිපියක හෝ තිබී දැයි දැනගන්නට නැත. මා දන්නා තරමින් එහි මූලාශ්‍රය පිළිබඳ කිසිවකු කිසිවක් කියා නැත. එහෙත් ඒ මතය ඇතැම් දෙනා අතර පැතිර ගොස් ඇත. විශේෂයෙන් ම බෞද්ධකම සමග යම් යම් ප්‍රශ්න ඇති අය ඒ මතයට නැඹුරු වෙති.

හෙළ හවුළට ද භික්ෂූන් වහන්සේ සමග ගැටළු විය. විශේෂයෙන් ම සිංහල භාෂාවෙන් ලියා තිබූ ධර්මය පාලියෙන් ලිවීම පිළිබඳ ඔවුන්ට ප්‍රශ්න විය. එසේ ධර්මය පාලියෙන් ලිවීම හේතුවෙන් සිංහල භාෂාවට හා එහි වර්ධනයට තදබල පහරක් එල්ල විය  යන්න ඔවුන්ගේ අදහස විය. සිංහල පොත් පාලියට පරිවර්තනය කිරීම සිංහල භාෂාවට ප්‍රශ්නයක් බව අමුතුවෙන් කිවයුතු නො වේ. මේ පාලි බස පිළිබඳ ප්‍රශ්නය කෙතරම් දුර දිග ගියේ ද කිවහොත් කුමාරතුංග මහතා එතරම් සාධක නොමැතිව වුව ද පාලි භාෂාව මහාවිහාරික භික්ෂූන් වහන්සේ විසින් නිර්මාණය කරන ලද භාෂාවක් යැයි කීවේ ය. කුමාරතුංග මුනිදාස මහතාට භාෂාව ජාතියේ ඉතා ම වැදගත් සාධකය විය. භාෂාව අඩපණ වූ කල ජාතිය ම අඩපණ වේය යන්න ඒ මහතාගේ අදහස විය.

මෙරට ඉතිහාසය මෙරටින් ම පමණක් ගොඩනැගීමට  උත්සාහ කළ කුමාරතුංග මුනිදාස මහතා ඒ සඳහා විෂ්ණු පුරාණයේ සඳහන් ඇතැම් තොරතුරු යොදා ගත්තේ ය. එතුමා ඒ තොරතුරු ඒ අයුරින් ම යොදා නොගත් නමුත් එයට පාදක වූයේ හින්දු පොත පත ය. ඒ අතර ඒ මගතා සිංහල භාෂාව (හෙළ බස) මෙරට ම නිෂ්පාදනයක් ලෙස පිළිගත්තේ ය. මහාවිහාරික භික්ෂූන් වහන්සේ ඒ මහතා අතින් විවේචනය වූ බැවින් පොදුවේ ගත්කල භික්ෂූන් වහන්සේ එතුමාගේ මත පිළිබඳ එතරම් කැමැත්තක් නො දැක්වූහ.

මහාවිහාරයට විරුද්ධවීම හා පඬුඅබා එසවීම අතර ඇත්තේ සම්බන්ධයකි. මහාවිහාරයට විරුද්ධවන්නෝ බොහෝ විට පඬුඅබාට පක්ෂපාති වෙති. අනෙක් අතට පඬුඅබාට පක්ෂපාති වන්නෝ බොහෝ විට මහාවිහාරයට විරුද්ධ වෙති. ඒ පක්ෂපාතවීම් හා විරුද්ධවීම් එක ම ආකාරයකට සමාන්තර ව සිදුවන්නේ යැයි මෙයින් අදහස් නො කෙරෙයි. කුමාරතුංග මුනිදාස මහතාට මහාවිහාරය සමඟ ප්‍රශ්න ඇතිවූයේ සිංහලෙන් තිබූ පොතපත පාලියට පෙරළීම හේතුකොට ගෙන ය. අද ඇතැමුනට වෙනත් හේතු නිසා මහාවිහාරයට හා බෞද්ධ මූලයට පහර ගැසීමට අවශ්‍ය වෙයි. ඔවුහු තම අභිප්‍රාය කිසි විටෙකත් හෙළිදරවු නො කරති.

මහාවිහාරයට පහර ගසන්නෝ බොහෝ විට අභයගිරියට පක්ෂපාත වෙති. මහාවිහාරය විජාතික දකුණු භාරතීය භික්ෂූන්ගේ මධ්‍යස්ථානයක් ලෙස හඳුන්වන්නෝ බොහෝ විට අභයගිරිය දේශීය භික්ෂූන් වහන්සේගේ මධ්‍යස්ථානය ලෙසත් සිංහල ජාතියේ කලාශිල්ප, විද්‍යා ආදියෙහි උල්පත ලෙසත් අභයගිරිය දකිති. මේ අය අතර කිසිම දේශීයත්වයක් නොමැති රාජ්‍ය නොවන සංවිධානවලින් යැපෙන්නන් ද සිටීම පුදුමයට කරුණක් නො වේ. ඔවුන් අභයගිරිය ඔසවන්නේ මහාවිහාරයට පහර දීමට මිස අභයගිරිය කෙරෙහි වූ භක්තියක් ගෞරවයක් නිසා නො වේ.

අද ජීවත්වන බොහෝ විජාතික බලවේගවල ක්‍රියාකරුවන්, බෞද්ධ විරෝධීන් ආදී පිරිස මහාවිහාරයට එරෙහි ව අභයගිරියට  ආවඩන්නේ යහපත් චේතනාවෙන් නම් නො වෙයි. ඔවුන්ට අවශ්‍ය මහාවිහාරයේ අනුප්‍රාප්තිකයන්ට විරුද්ධ වීම සහ අවසානයේ දී සිංහලයන්ට විරුද්ධ වීම ය. මොවුන්ට අමතක වන කරුණ නම් අභයගිරිය මහාවිහාරයට වඩා විදෙස්වලින් පැමිණි මතවාදවලට දොර විවෘත කිරීම ය. අභයගිරිය කිසිදා පූර්ණ මහායාන ආයතනයක් නොවන්නට ඇත. එහෙත් ලංකාවට මහායානය හඳුන්වා දුන්නේ අභයගිරිය ඔස්සේ ය. ථෙරවාදයෙහි නොමැති දේශීයත්වයක් මහායානයෙහි ඇත්තේ කෙසේ ද යන්න මට නම් ප්‍රශ්නයකි.

© Prof. Nalin De Silva

අභයගිරිය, මහායානය ආදී ආයතන හා පඬුඅබා ආදී රජවරු මෙරට ඉතිහාසය සිංහල බෞද්ධ ඉතිහාසයට විරුද්ධ නැවතත් ලිවීමේ යෙදී සිටින පඬියන්ට ඉතා වැදගත් වනු ඇත. මෙරට සිංහල බෞද්ධ උරුමය නැතිකිරීම ඔවුන්ගේ අවසාන අරමුණ වෙයි. මේ සම්බන්ධයෙන් මෑතක දී ඇතැමුන් පැවසීමට නැඹුරු වී ඇත්තේ අභයගිරියට ද මහාවංසයක් තිබූ බවත් අද වන විට එය නැති වී ගොස් ඇති බවත් ය. අභයගිරියේ ලියැවිණි යැයි කියන මහාවංසය උත්තරමූල මහාවංසය ආදී නම්වලින් හැඳින්වෙයි.

අභයගිරියේ එවැනි මහාවංසයක් තිබිණි යැයි සිතමු. ඒ පොතෙන් යක්ෂ ගෝත්‍රිකයන් සම්බන්ධයෙන් වැදගත් කරුණු හෙළිවීමට ඉඩ තිබිණි යැයි ද සිතමු. එහෙත් ඒ පොත අද වන විට නැතිව ගොස් ඇත්තේ ඒ ජයග්‍රාහකයන්ගේ පොතක් නොවන බැවිනි. ජයග්‍රාහකයන් තම පොත් ආරක්ෂාකරනවා පමණක් නොව ඒ මතු පරම්පරාවලට කියවීම සඳහා නැවත නැවත පිටපත් කරන බව ද පැහැදිලි ය. පඬුඅබා රජුගේ ජයග්‍රහණය කාගේ ජයග්‍රහණයක් ද යන ප්‍රශ්නය දැන් පැන නගියි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva